00053

**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

**අධ්‍යාපන පීඨය**

**අධ්‍යාපනවේදී (විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය) පිළිබඳ**

**උපාධි වැඩසටහන - පස්වන මට්ටම 2015/2016**

**අවසාන පරීක්ෂණය - 2016**

**ESU3240- තුලනාත්මක අධ්‍යාපනය හා අධ්‍යාපන ගැටලු**

**කාලය : පැය (03) තුනයි.**

---

**දිනය - 2016 සැප්තැම්බර් 11 වන දින** **වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා**

---

**1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසින් ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## 1 වන කොටස

01. විෂය ක්ෂේත්‍රයක් ලෙස තුලනාත්මක අධ්‍යාපනයේ කාර්යයන් පැහැදිලි කරන්න.

02. ජාතික අධ්‍යාපන පද්ධති සංවර්ධනය කිරීමේ දී තුලනාත්මක අධ්‍යාපනය භාවිත කිරීම නිසා උද්ගත වී ඇති ගැටලු හෝ මතවාද දෙකක් (02) තෝරා ගත් රටක් ඇසුරින් පැහැදිලි කරන්න.

03. "බහුවිධ සමාජය" යන පදය නිර්වචනය කරන්න.

04. බ්‍රිතාන්‍ය යටත් විජිතයක්ව පැවතීමේ ප්‍රතිඵල ලෙස ශ්‍රී ලංකාවේ වර්තමාන අධ්‍යාපන පද්ධති තුළ දැකිය හැකි සමානතා පහක් (05) සඳහන් කරන්න.

05. ගෝලියකරණයේ ප්‍රතිඵල ලෙස ශ්‍රී ලංකාවේ ද්විතියික අධ්‍යාපනයේ සිදුව ඇති ධනාත්මක වෙනස්කම් දෙකක් (02) පැහැදිලි කරන්න.

06. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලයීය අධ්‍යාපන පද්ධතිය පිළිගැනීම සඳහා 1971 ජයරත්න කමිටුව විසින් කරන ලද ප්‍රධාන නිර්දේශය සඳහන් කරන්න.

07. ලන්දේසි යුගයේ දී ශ්‍රී ලංකාවේ පැවති අධ්‍යාපන ක්‍රමයේ ලක්ෂණ පහක් (05) සඳහන් කරන්න.

08. 1950 දී ශ්‍රී ලංකාවේ පාසල් ව්‍යුහය සඳහා යෝජිත වෙනස්කම් මොනවාදැයි දක්වන්න.

(ලකුණු 05 x 08 = 40)

00053

## 2 වන කොටස

09. (i) 1972 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මගින් ප්‍රාග් වෘත්තිය විෂය හඳුන්වාදීමේ අරමුණු සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) පාසල තුළ ප්‍රාග් වෘත්තිය විෂය ක්‍රියාත්මක කිරීමේ ප්‍රායෝගිකභාවය පිළිබඳව විභාග කරන්න. (ලකුණු 08)

(iii) සමස්තයක් ලෙස සලකා බැලීමේ දී, ප්‍රාග් වෘත්තිය විෂය ක්‍රියාත්මක කිරීම සාර්ථක නොවූයේ නම්, එවැනි තත්ත්වයක් ඇති වීමට බලපෑ හේතු සඳහන් කරන්න.

(ලකුණු 09)

10. (i) 1943 අධ්‍යාපනය පිළිබඳ විශේෂ කාරක සභාව විසින් ශ්‍රී ලංකාවේ එවකට පැවති අධ්‍යාපනය පිළිබඳව හඳුනාගත් දුර්වලතා පහක් (05) සඳහන් කරන්න. (ලකුණු 05)

(ii) ඉහත සඳහන් කරන ලද දුර්වලතා මඟහරවා ගැනීමට 1943 අධ්‍යාපනය පිළිබඳ විශේෂ කාරක සභාව විසින් කරන ලද නිර්දේශ උදාහරණ තුනක් (03) දක්වමින් විස්තර කරන්න. (ලකුණු 15)

11. (i) ගුරු වෘත්තිය සංවර්ධන වැඩසටහන් සඳහා තුලනාත්මක අධ්‍යාපනය විෂයයක් ලෙස හඳුන්වාදීමේ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii) ගුරුවරයකුට තුලනාත්මක අධ්‍යාපනයෙන් ලත් දැනුම පවත්නා පාසල් පද්ධතියට අන්තර්ගත කලහැකි ආකාරය විභාග කරන්න. (ලකුණු 07)

(iii) ඉහත සඳහන් කරන ලද දැනුම අන්තර්ගත කිරීමේදී ගුරුවරයකු මුහුණපාන ගැටලු තුනක් (03) සඳහන් කර, එම ගැටලු මගහරවා ගැනීමට යෝජනා ඉදිරිපත් කරන්න.

(ලකුණු 08)

12. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය මුහුණ දෙනු ලබන එක් ගැටලුවක් තෝරා ගන්න.

(i) ලෝකයේ සංවර්ධිත රටවල පවත්නා තත්ත්වය සමඟ තෝරාගත් ගැටලුව සංසන්දනය කරන්න. සුදුසු උදාහරණ දක්වන්න. (ලකුණු 06)

(ii) ඉහත සඳහන් සංවර්ධිත රටවල් එම ගැටලුව මඟහරවා ගෙන ඇති ආකාරය විභාග කරන්න. උදාහරණ දක්වන්න. (ලකුණු 07)

(iii) ඉහත සඳහන් ගැටලුව ශ්‍රී ලාංකික සන්දර්භය තුළ මඟහරවා ගත හැකි ආකාර විභාග කරන්න. (ලකුණු 07)

13. "පෙර නොවූ විරූ පරිමාණයෙන් අධ්‍යාපනයේ ජාත්‍යන්තරීකරණයක් ඇති කිරීමට ගෝලීයකරණය හා තාක්ෂණය යන බලවේග එක්ව සමත්ව ඇත."

මෙම ප්‍රකාශය ඔබ එකඟ වේ ද? සුදුසු උදාහරණ දක්වමින් ඔබේ පිළිතුර සනාථ කරන්න.

(ලකුණු 20)

14. පහත සඳහන් ඕනෑම මාතෘකා දෙකක් (02) පිළිබඳව සටහන් ලියන්න.

(i) එක්සත් රාජධානියේ ද්විතියික අධ්‍යාපනය

(ii) ශ්‍රී ලංකාවේ ජාතික තලයේ දී පවත්නා භාෂා ප්‍රතිපත්තිය

(iii) පැරණි ශ්‍රී ලංකාවේ පැවති අධ්‍යාපන ක්‍රමය

(ලකුණු 10 x 02 = 20)

හිමිකම් ඇවිරිණි.

00053

**THE OPEN UNIVERSITY OF SRI LANKA**

**FACULTY OF EDUCATION**

**BACHELOR OF EDUCATION(SPECIAL NEEDS EDUCATION)**

**DEGREE PROGRAMME (2015/2016)**

**FINAL EXAMINATIONS – 2016**

**ESU3240– COMPARATIVE EDUCATION AND EDUCATIONAL PROBLEMS**

**DURATION – THREE (03) HOURS.**

Date: 11th September 2016 Time: 9.30 a.m. -12.30 p.m.

**Answer all questions in Part I & any three (03) questions from Part II.**

## PART I

01. Explain the functions of Comparative Education as a discipline?

02. Explain **two (02)** problems or issues occurred in one selected country due to the use of Comparative Education to develop national systems of education.

03. Define the term "Plural Society".

04. State **five (05)** similarities that can be seen in the modern educational system of Sri Lanka as a result of the British colonial rule.

05. Explain **two (02)** positive changes that have taken place in the Secondary Education of Sri Lanka, as a result of globalization.

06. What is the major recommendation made by Jayarathna Committee in 1971 in order to reorganize the university education system in Sri Lanka?

07. State **five (05)** characteristics of education system in Sri Lanka during the Dutch period.

08. State the proposed changes to the Sri Lankan school structure in 1950.

## PART II

09. i. State the objectives of introducing the Pre-Vocational Subject, in the curriculum reforms of 1972.

(03 marks)

ii. Examine the practicality of implementation of the Pre-Vocational Subject in schools.

(08 marks)

iii. If the implementation of Pre-Vocational Subjects was not entirely successful, what were the reasons for such a situation?

(09 marks)

10. i. State **five (05)**shortcomings identified by the Special Committee on Education in 1943 of the existing system of education in Sri Lanka.

(05 marks)

ii. Illustrate with **three (03)** examples, recommendations made by the Special Committee in Education (1943) to rectify the above mentioned shortcomings.

(15 marks)

11. i. Explain the importance of introducing Comparative Education as a subject in to teacher education programme.

(05 marks)

ii. Examine how a teacher could incorporate the knowledge gained from comparative education, in to existing school system.

(07 marks)

iii. State **three (03)** problems faced by the teachers when incorporating above mentioned knowledge and make suggestions to overcome the mentioned problems.

(08 marks)

12. State **one (01)** educational problems faced by the Sri Lankan education system,

   i. Compare the selected educational problem with the situation in the developed countries in the world. State examples where necessary.

   (06 marks)

   ii. Examine how the developed countries mentioned have overcome the problem. Give examples.

   (07 marks)

   iii. Examine how we can overcome the above mentioned problem in the Sri Lankan context.

   (07 marks)

13. "Globalization and technology have succeeded in leading to an internationalization of education on an unprecedented scale in the world".
Do you agree? Illustrate your answer with suitable examples.

   (20 marks)

14. Write notes on **two (02**) of the following topics.
   i. Secondary education in United Kingdom.
   ii. Language policy at national level in Sri Lanka.
   iii. The indigenous system of education in ancient Sri Lanka.

   (10 x 2 = 20 marks)

*-Copyrights reserved-*